# තතියො පාඨො

## වානරො



වානරො වනෙ වසති. වානරා ඵලානි ඛාදන්ති. දාරකො වානරං පහරති. මනුස්සා වානරෙ පොසෙන්ති. වානරෙන ඵලං ඛාදීයතෙ. වානරෙහි භින්නසාඛායො භූමියං පතන්ති. දාරකො වානරස්ස ඵලං දදාති. මනුස්සා වානරානං ජලං දෙන්ති. දාරකො වානරම්හා ඵලං ගණ්හාති. ව්‍යාධො වානරෙහි න භායති. වානරස්ස නඞ්ගුට්ඨං දීඝං භවති. වානරානං සරීරෙසු ලොමානි සන්ති. අහං වානරෙ දයං කරොමි. කෙචි ගුණා වානරෙසු සන්ති.

(පාලි රචනා 2)

**පදමාලාව**

| | | | | | |
|---|---|---|---|---|---|
| **වානරො** | - | වඳුරා | **වනෙ** | - | වනයෙහි |
| **වසති** | - | වාසය කරයි | **ඵලානි** | - | ගෙඩි |
| **ඛාදන්ති** | - | කති | **දාරකො** | - | දරුවා |
| **පහරති** | - | පහර දෙයි | **මනුස්සා** | - | මිනිස්සු |
| **පොසෙන්ති** | - | පෝෂණය කරති | **ඛාදීයතෙ** | - | කනු ලැබෙයි |
| **භින්නසාඛායො** | - | බිඳුණු අතු | **පතන්ති** | - | වැටෙති |
| **දදාති** | - | දෙයි | **දෙන්ති** | - | දෙති |
| **ගණ්හාති** | - | ගනියි | **ව්‍යාධො** | - | වැද්දා |
| **භායති** | - | භයවෙයි | **නඞ්ගුට්ඨං** | - | වලිගය /නගුට |



නොමිලේ බෙදා හැරීම පිණිසයි

| | | | | | |
|---|---|---|---|---|---|
| **භවති** | - | වෙයි | **සරීරෙසු** | - | ශරීරවල |
| **ලොමානි** | - | ලොම් | **සන්ති** | - | වෙති |
| **දයං** | - | දයාව | **කරොමි** | - | කරමි |
| **කෙචි** | - | කිසියම් | **වානරෙසු** | - | වඳුරන් කෙරෙහි |

## අභ්‍යාස

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට පාලි භාෂාවෙන් පිළිතුරු සපයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| **කුහිං** | - | කොහි | **කානි** | - | මොනවා |
| **කො** | - | කවරෙක් | **කෙ** | - | කවරහු |

උදා:- **කෙ ඵලානි඼ාදන්ති? වානරා ඵලානි ඛාදන්ති.**

i. වානරො කුහිං වසති ?
ii. වානරා කානි ඛාදන්ති ?
iii. කො වානරං පහරති ?
iv. කෙ වානරෙ පොසෙන්ති ?
v. කො වානරානං ජලං දදාති ?

2. පහත සඳහන් වාක්‍යයන්හි හිස්තැන් පුරවන්න.

i. .................................. වනෙ වසති.
ii. අහං .......................... පස්සාමි.
iii. මයං ඵලානි ....................
iv. ...................... වානරං පහරති.
v. වානරානං සරීරෙසු .................. සන්ති.

## පද

තනි අකුරක් හෝ අකුරු සමූහයකින් යුක්ත අර්ථවත් වචන 'පද' නමින් හැඳින්වේ. පද සමූහයක් එකතුවීමෙන් වාක්‍යයක් නිර්මාණය වේ. **(පදසමූහො වාක්‍යං)** වාක්‍යයක් යනු එක් ආඛ්‍යාතයක් ඇති කාරක සහිත පද සමූහයකි. පාලි භාෂාවේ පද වර්ග හතරකි.

ඒවා නම්,

1. **නාම පද** - බුද්ධො, ලොකො, රාජා, ඵලං, යාචකෙන, වනිතාහි
2. **ක්‍රියා පද** - සයති, ධාවති, පූජෙති, අපචි, ගච්ඡිස්සති
3. **නිපාත පද** - ඉධ, අථ, ච, යථා, එවං
4. **උපසර්ග පද** - ප-පබොධති, ආ-ආහරති, අධි-අධිවසති, අනු-අනුගච්ඡති

''**වානරො වනෙ වසති**'' මෙම වාක්‍යයේ පද තුනක් දක්නට ලැබේ. වාක්‍යයක් පදවලින් නිර්මාණය වන බව මෙයින් පැහැදිලි වේ.

**නාමපද**

පුද්ගලයෙක්, සත්වයෙක්, ස්ථානයක්, ද්‍රව්‍යයක් හෝ සංකල්පයක් සඳහා ව්‍යාවහාර කෙරෙන ශබ්ද '**නාම**' ලෙස හැඳින්වේ. ඒ ඒ අර්ථයන්ට අනුව නැමෙන හෙයින් ද ඒවා '**නාම**' නම් වේ. '**නාම**' යනු ශබ්ද ප්‍රකෘතියයි. ශබ්දයන්ගේ මූල අවස්ථාවයි. ශබ්ද ප්‍රකෘතියේ විභක්ති ප්‍රත්‍යය ආදිය දකින්නට නැත. එසේ වුව ද එම නාම අර්ථ සහිත ය.

නාමයකට විභක්ති ප්‍රත්‍යයක් එක් වීමෙන් නාමපද සෑදේ. සචේතනික හා අචේතනික වශයෙන් දෙයාකාර වන නාමපදවල ඒකවචන හා බහුවචන වශයෙන් වචනභේදයක් දැකිය හැකි ය.

| පුල්ලිංග | | | ස්ත්‍රීලිංග | | | නපුංසකලිංග | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඒකවචන | බහුවචන | | ඒකවචන | බහුවචන | | ඒකවචන | බහුවචන |
| 1. | බුද්ධො | බුද්ධා | 4. | කඤ්ඤා | කඤ්ඤායො | 7. | ඵලං | ඵලානි |
| 2. | සුනඛො | සුනඛා | 5. | රත්ති | රත්තියො | 8. | චිත්තං | චිත්තානි |
| 3. | මිගො | මිගා | 6. | නදී | නදියො | 9. | නයනං | නයනානි |

නාමපද මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදායේ '**ස්‍යාද්‍යන්ත**' නමින් හැඳින්වේ. එම නාමය දී ඇත්තේ එකී නාම **සි, යො, අං, යො,** ආදී නාම විභක්ති ප්‍රත්‍යයන්ගෙන් අන්ත වන බැවිනි.

ශබ්ද ප්‍රකෘතිය අගට විභක්ති ප්‍රත්‍යයක් එකතුවීමෙන් නාමපදයක් සකස් වන ආකාරය තේරුම් ගැනීමට පහත නිදසුන බලන්න.

| | |
|---|---|
| බුද්ධ | නාමය |
| බුද්ධ+සි | විභක්ති ප්‍රත්‍යය (පඨමා විභක්ති ඒකවචන ප්‍රත්‍යය) |
| බුද්ධ+ඔ | ඔ ආදේශය |
| බුද්ධ්+අඔ | පූර්ව ස්වරය ලොප්වීම |
| බුද්ධෝ | ව්‍යඤ්ජනය ස්වරයට පැමිණිවීම |
| බුද්ධෝ | නාමපදය |

පහත දැක්වෙන වගුව අධ්‍යයනය කරන්න.

| ශබ්ද ප්‍රකෘතිය | විභක්ති ප්‍රත්‍යය | නාමපදය |
|---|---|---|
| දෙව | දෙව+සි (ඔ) | දෙවො |
| අත්ත | අත්ත+යො | අත්තානො |
| අග්ගි | අග්ගි+සු | අග්ගිසු |
| දණ්ඩී | දණ්ඩී+යො | දණ්ඩී |
| භික්ඛු | භික්ඛු+මහා | භික්ඛුමහා |
| චිත්ත | චිත්ත+හි | චිත්තෙහි |
| කඤ්ඤා | කඤ්ඤා+යො | කඤ්ඤායො |
| රාජ | රාජ+හි | රාජූහි |
| බුද්ධ | බුද්ධ+නං | බුද්ධානං |

## නාම ප්‍රභේද

1. නාමනාම
2. සබ්බනාම
3. සමාසනාම
4. තද්ධිතනාම
5. කිතකනාම

යනුවෙන් නාම ප්‍රභේද පහක් දක්නට ලැබේ.

## නාමනාම

'නාමනාම' යනු කේවල නාමයි. මේ නාමයන් කොටස් හතරකට බෙදේ.

1. ජාතිනාම - නර, සීහ, මිග, දෙව, කඤ්ඤා, යුවති, ආචරිය
2. ද්‍රව්‍යනාම - පීඨ, ලෙඛනී, වෙත්ත, ඵල, සාඛා, පොත්ථක
3. ගුණනාම - දයා, මෙත්තා, කරුණා, පඤ්ඤා, ගුණවන්තු
4. සංඥානාම - නාරද, බිම්බිසාර, ආනන්ද, ධම්මපාල, සීලරතන

**සබ්බනාම**

'සර්වනාම' යන්නෙහි අදහස සෑම නාමයකට ම පොදුවේ යෙදිය හැකි නාම යන්නයි. එසේ ම සර්වනාම පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග යන ලිංගත්‍රයේ ම යෙදිය හැකි ය. සබ්බ, කතර, උභය, ඉතර, තුම්හ, අම්හ, ත ආදිය සර්වනාමයි. සර්වනාම පද කිහිපයක් පහත දැක්වේ.

සො, තෙ, සබ්බෙ, අඤ්ඤතරො, ඉතරං, තස්ස, එතානි, අහං, මයං, ත්වං

**සමාස නාම**

පද දෙකක් හෝ කිහිපයක් තනි පදයක් බවට පත්කිරීම 'සමාස' නම් වේ. එසේ සමාසවීමෙන් සෑදෙන පද 'සමාසනාම' නම් වේ.

නීලුප්පලං, අන්ධබධිරො, සාරිපුත්තත්ථෙරො
තිලොකං, චතුද්දිසං, පඤ්චසීලානි
ගාමගතො, චොරභයං, සීලසම්පන්නො
ඛීණාසවො, තථාගතො, ලම්බකණ්ණො
චන්දසූරියා, නරනාරියො, හත්ථපාදං
උපනගරං, දුබ්භික්ඛං

**තද්ධිත නාම**

නාමයකට පරව ප්‍රත්‍යයක් එක්වීමෙන් සෑදෙන නාම 'තද්ධිතනාම' නම් වේ.

වාසුදෙවො කච්චායනො

භාගිණෙයො සාක්‍යපුත්තිකො
පාපතමො වාසෙට්ඨො

### කිතක නාම

ධාතුවකට පරව ප්‍රත්‍යයක් එක්වීමෙන් සෑදෙන නාම 'කිතක නාම' නම් වේ.

කුම්භකාරො පාලකො
ගච්ඡමානො තිට්ඨන්තො
නායකො දායකො

### අභ්‍යාස

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. 'පද' යනු මොනවා ද ?
ii. පාලි භාෂාවේ පද වර්ග කීය ද ? ඒවා නම් කරන්න.
iii. 'ශබ්ද ප්‍රකෘතිය' යනු කුමක් ද?
iv. නාමපද යනු කවරේ ද?
v. නාමපද 'ස්‍යාද්‍යන්ත' නමින් හැඳින්වෙන්නේ ඇයි ?
vi. නාමපදයක් සකස් කරගන්නේ කෙසේ ද?
vii. නාමපද ප්‍රභේද වශයෙන් කීය ද? ඒවා නම් කරන්න.
viii. 'වානරො' යන ඡේදයේ ඇති නාමපද දහයක් සොයා ලියන්න.
ix. ඒකවචන නාමපද දහයක් ලියා ඒවා බහුවචනයට හරවන්න.
x. 'නාමනාම' සහ 'සර්වනාම' පද සොයා ලියන්න.

2. පහත සඳහන් පාලි වාක්‍ය සිංහලට නගන්න.

i. බුද්ධො ධම්මං දෙසෙති.
ii. මිගො ධාවති.
iii. කස්සකා කසන්ති.
iv. ලෙඛකො ලිඛති.

v. සුනඛා භුඤ්ජන්ති.
vi. අස්සා ධාවති.
vii. වාණිජො නිසීදති.
viii. ගොපාලො රක්ඛති.
ix. වානරො රුක්ඛං ආරුහති.
x. බාලකා අඞ්ගණෙ කීළන්ති.

**3. පහත සඳහන් වාක්‍යය පාලියට නගන්න.**

i. වඳුරෝ නගිති.
ii. එළුවෝ දුවති.
iii. මුවා සිටියි.
iv. දාසයා ගෙනයයි.
v. ගොවියා සීසායි.
vi. ලියන්නා පහනක් ගෙනයයි.
vii. අම්මා බත් උයයි.
viii. ළමයා ක්‍රීඩා කරයි.
ix. පියා කුඹුරට යයි .
x. මම පිරිවෙණට යමි.

චිත්තස්ස දමතො සාධු, චිත්තං දන්තං සුඛාවහං

**සිත දමනය කිරීම මැනවි. හික්මවන ලද සිත සැප ගෙන දෙන්නේ ය.**

(ධම්මපදපාළි, චිත්තවග්ග, 3 ගාථාව)